සිංහල භාෂාව හා සාහිත්‍යය

- ඉගෙනුම් ඵල
  - ලිපි ලේඛන කියවා වාක් කෝෂීය විවිධතා ඉදිරිපත් කරයි.
  - වචනවල අර්ථය සඳහා අදාළ අවස්ථාව හා සිද්ධිය සම්බන්ධ වන බව ප්‍රකාශ කරයි.
  - භාෂා භාවිතයේ දී එම වචන අර්ථවත්ව යොදයි.

- 10 ශ්‍රේණියේ සිංහල භාෂාව පෙළ පොතෙහි 28 පිටුව හොඳින් කියවන්න. අනතුරුව පහත දැක්වෙන අභ්‍යාසයෙහි නියැලෙන්න.

**1.** පහත ‘අ’ කොටසේ ඇති රූඪියේ අදහසට ගැලපෙන ප්‍රකාශය ‘ආ’ කොටසෙන් තෝරා යා කරන්න.

| | අ | ආ |
|---|---|---|
| I. | කරබාගෙන ඉන්නවා | වසඟ කරනවා |
| II. | අස්සක් මුල්ලක් නැර | යමක් සඟවනවා |
| III. | කොළේ වහනවා | කිසිම වැදගත් කමක් නෑ |
| IV. | මෙලෝ රහක් නෑ | නිශ්ශබ්දව ඉන්නවා |
| V. | දැපෙනෙ දාගන්නවා | හැමතැනම |

**2.** පහත දැක්වෙන වාක්‍යවල ඉරි ඇඳි කොටසට අදාළ අරුත වරහන් තුළින් තෝරා හිස් තැනෙහි ලියන්න.

I. තරඟ ප්‍රතිපල එනතුරු අපි <u>පුල පුලා</u> (..................................) බලා සිටියෙහු.

II. දිළිඳුකම සමාජයෙන් <u>අතුගා</u> (..................................) දැමිය යුතු ය.

III. වැරදි කිරීමට <u>උඩගෙඩි දීම</u> (..................................) ද බලවත් වරදකි.

IV. ඔහු <u>සිකුරට ම</u> (..................................) ජය ගන්නා බව බොහෝ දෙනා විශ්වාස කළහ.

V. දෙපිරිසක් අතර පැවති <u>කළඹ ඇදීම</u> (..................................) නිසා පාරේ වැඩ ඇන සිටියේ ය.

**(නැතිකර, අනුබල දීම, හරියට ම, එකඟතාවක් නැතිව, උනන්දුවෙන්)**

**3.** පහත දැක්වෙන ප්‍රස්තාව පිරුළු වල අදහස යටින් දී ඇති තිත් ඉරමත ලියන්න.

I. හිස රදේට කොට්ටෙ මාරු කරන්නා වගේ

..........................................................................................................

II. දියකාවගෙ පිටේ ලුණු හැංගුවා වගේ

..........................................................................................................

III. කම්මැලියාට දිවැස් තියෙනවාලු

..........................................................................................................

IV. මඟුල් දාට මුත්තාත් අමුත්තාලු

..........................................................................................................

V. උපන්ගෙයි ගතිය බලි ඇරියත් නැරේ

..........................................................................................................

සිංහල සාහිත්‍ය සංග්‍රහය

1. සාහිත්‍ය සංග්‍රහය පොතේ පිටු අංක 14 – 16 පිටු කියවා පහත දැක්වෙන ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

I. මහෞෂධ පඬිතුමා ධර්ම යුද්ධයට යාමට පෙර සූදානම් වූයේ කෙසේ ද?

..........................................................................................................

II. මහෞෂධ පඬිතුමා වේදේහ රජුගෙන් ඉල්ලා ගත්තේ කුමක් ද?

..........................................................................................................

III. පලාගිය සේනාව ආපසු ගොස් කඳවුරු බැඳීමට හේතු වූ කේවට්ටගේ ප්‍රකාශය සඳහන් කරන්න.

..........................................................................................................

..........................................................................................................

..........................................................................................................

2. අවස්ථා සම්බන්ධය ලිවීමට හුරුවීම පිණිස ඊට අදාළ පහත අභ්‍යාසය කරන්න. එක් එක් ප්‍රකාශය කා විසින් කියන ලද්දේ ද?, ඉරි ඇඳි පද වලින් ඇඟවෙන්නේ කවු ද?

| | | කියූ තැනැත්තා | හැඟවෙන අය |
|---|---|---|---|
| I. | **සබඳ** තොප විසින් කුමක් දක්නා ලද ද? | | |
| II. | යහපත **ආචාරිනී,** තොප කී ලෙස ම කරමි. | | |
| III. | **දේවයිනි**, මේ වේදේහ රජුගේ බලයෙක් නොවෙයි. | | |
| IV. | **මැණියන් වහන්ස**, මා දන්නේ මෙපමණක් ම ය. | | |
| V. | **පුත**, මා විසින් කුමක් කළ මනා ද? | | |